# මිනිස් චර්යාවේ කායික පදනම පිළිබඳ බෞද්ධ විග්‍රහය

Buddhist analysis of the phisiological foundation of human behaviour

ගොමිල ගුණාලංකාර හිමි

**Abstract**

The function of the beings is a combination of physical and mental elements which are interconnected and interdependent. The biological evolution of the species reflects the physiological aspect of the psychological processes of sexual desire, sensation and perception, memory, learning, gender and sexuality etc. These aspects are deeply discussed and studies in the field of biological psychology (psychophysiology) of western psychology, but not much studies are appeared on this fact in the field of Buddhist psychology. However, the Buddhist teaching can be recognized as with rich knowledge on the psychophysiological process of beings. Thus, the current study was focused on identifying and analyzing the concepts related with psychophysiology of the western psychology, exploring the physiological foundation of human behavior and mental process. The study was conducted under thematic analysis of qualitative methods, and studied the Buddhist teachings on the origin of the human beings on the earth and their evolution, human development, the connection and co-process of forms/ physical and mental elements, physiological route of sensation and perception etc. referring to the Sutta pitaka and Abhidhamma pitaka. It was concluded that, in accordance with the Buddhist teachings, there is a constant and strong combination between mental and physical processes, and all human behaviors are made through the psychophysiological process, and there is a

direct physiological and psychological influence on deciding one’s sexuality and gender, and the particular knowledge is significantly applicable to understand the individual characters in counselling and psychotherapeutic interventions.

**Keywords:** Buddhist Teaching, Human Behaviour, TPhysiological Foundation, he Origin and Evolution of Humans.

**සාරසංක්ෂේපය**

සත්වයාගේ ක්‍රියාකාරිත්වය කායික හා මානසික අංශද්වයෙහි අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ, අන්‍යොන්‍ය පරායත්ත ක්‍රියාකාරිත්වය අනුව සිදු වේ. වංශප්‍රවේණික වශයෙන් සිදුවූ ජීවී පරිණාමය, ලිංගික ක්‍රියාකාරිත්වය, සංවේදනය හා සංජානනය, මතකය හා ඉගෙනුම, ලිංගිකත්වය හෙවත් ස්ත්‍රී පුරුෂභාවය ආදිය මිනිස් චර්යාවේ ජීවවිද්‍යාත්මක ක්‍රියාවලියෙහි ලා සැලකිය යුතු ක්ෂේත්‍රයන් ය. මෙම අංශයන්හි කායික පදනම හෙවත් මිනිස් චර්යාවේ ජීවවිද්‍යාත්මක පදනම පිළිබඳව බටහිර මනෝවිද්‍යාවේ ශාඛාවක් වන ජීවමනෝවිද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ පුළුල් විග්‍රහයන් ඇතුළත් වුව ද බෞද්ධ මනෝවිද්‍යාව තුළ ඒ පිළිබඳ විශ්ලේෂණයන් ඉතා විරල ය. එසේ වුවත් පුද්ගලයා විග්‍රහ කරන බුදුදහම මානසික පදනම පමණක් නොසලකන අතර ජීවවිද්‍යාත්මක පදනම ද සැලකිල්ලට ගන්නා බව නාමරූප විග්‍රහය ආදි ඉගැන්වීම්වලින් පැහැදිලි වෙයි. එවැනි පසුබිමක් තුළ පුද්ගල චර්යාව සඳහා බලපාන කායික හෙවත් ජීවවිද්‍යාත්මක කරුණු බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගත වන ආකාරය සහ ඒ ආශ්‍රයෙන් බෞද්ධ දර්ශනය මූලික ජීවමනෝවිද්‍යාත්මක න්‍යාය රාමුවක් ගොඩනැගීමේ හැකියාව අධ්‍යයනය කිරීමේ අරමුණින් යුතුව මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙය පුස්තකාල පාදකව, බෞද්ධ මූලාශ්‍රයාගත න්‍යායාත්මක කරුණු අධ්‍යයනය ඔස්සේ සිදු කරන ලද ගුණාත්මක පර්යේෂණයකි. මෙහිදී ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍යය මූලාශ්‍ර ආශ්‍රයෙන් රැස් කරගන්නා ලද දත්ත ගුණාත්මක පර්යේෂණ ක්‍රමයට අයත් සන්ධාර විශ්ලේෂණය සහ තේමා විශ්ලේෂණ ක්‍රමය අනුව විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව මානව සම්භවය හා පරිණාමය, මානව සංවර්ධනය, කය සහ මනස අතර සම්බන්ධය, සතර මහාභූතධාතු මූලිකව සිදු වන

යාන්ත්‍රික ක්‍රියාවලිය, සංවේදනය හා සංජානන ක්‍රියාවලියට පාදක වන ජීවවිද්‍යාත්මක ක්‍රියාකාරිත්වය යන කරුණු අභිධර්ම පිටකයේ රූප විග්‍රහය සහ සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර ඇසුරින් අනාවරණය කර ගන්නා ලදී. එකී දත්ත මත පදනම්ව පුද්ගල චර්යාවෙහි කායික පැතිකඩ බෞද්ධ ඉගැන්වීම් තුළින් හඳුනාගත හැකි බව, පුද්ගල චර්යාව හා පෞරුෂය සඳහා ස්ත්‍රී පුරුෂ භාවය ඍජු බලපෑමක් සිදු කරන බව, මිනිස් චර්යාවට බලපාන කායික සාධක පිළිබඳ බුදු දහම තුළ ආවේණික කරුණු ඇතුළත් ප්‍රබල න්‍යායික පදනමක් සහිත බව සහ බෞද්ධ මනෝචිකිත්සනය තුළ පුද්ගල චර්යා සංස්කරණය කිරීමේදී මෙම කායික සාධක කෙරෙහි ද සැලකිලිමත් විය යුතු බව යන නිගමන ඉදිරිපත් කරන ලදී.

**ප්‍රමුඛ පද:** මානව සම්භවය හා පරිණාමය, මිනිස් චර්යාව, කායික පදනම, බෞද්ධ ඉගැන්වීම්

**හැඳින්වීම**

මිනිස් ශරීරය සහ ඒ හා සබැඳි මානව චර්යාව ඉතා සංකීර්ණ ජීවවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රියාවලියකින් යුතු වන්නකි. මිනිස් චර්යාවෙහි භෞතික පදනම අධ්‍යයනය කරන ජීවමනෝවිද්‍යාව (Biological Psychology) හෙවත් මනෝකායිකවිද්‍යාව (Psychophysiology) බටහිර මනෝවිද්‍යාව තුළ සුවිශේෂී විෂය පථයක් වන අතර මිනිසාගේ මෙන්ම වෙනත් සත්වයන්ගේ ද හැසිරීම් මෙහෙයවන ජීවවිද්‍යාත්මක ක්‍රියාවලීන් අවබෝධ කර ගැනීම සඳහාත් කායික ක්‍රියාකාරිත්වය අනුව මානසික ක්‍රියාවලිය වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම සඳහාත් එම දැනුම ප්‍රායෝගිකව භාවිත කෙරෙයි.

ජීවීන්ගේ වංශ ප්‍රවේණික පරිණාමය, පුද්ගල චර්යාව මෙහෙයවන ස්නායු පද්ධතිය හා හෝමෝන පද්ධතිය, සංවේදනය හා සංජානනය, මතකය හා ඉගෙනුම, ලිංගිකත්වය හෙවත් ස්ත්‍රීපුරුෂභාවය ආදිය මිනිස් චර්යාවේ කායික ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයට ඇතුළත් වේ (Kalat, 2004: 01). ශරීරය තුළ ක්‍රියාකාරී විවිධ පද්ධතීන් පිළිබඳවත් අසාමාන්‍ය චර්යාවන් සඳහා බලපාන ජීව විද්‍යාත්මක සාධක පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙහි විෂය පරාසය වේ. නූතනයේ

මනෝවිද්‍යාවේ සහ ස්නයු විද්‍යාවේ විද්වතුන්ගේ අවධානයට ලක්ව පවතින හා විද්‍යාත්මක පර්යේෂණ සිදු කරන ස්නායු මනෝවිද්‍යාව (Neuropsychology) ද මෙම ජීවමනෝවිද්‍යාවෙහි ම සංවර්ධනයක් ලෙස සැලකිය හැකිය.

බෞද්ධ මනෝවිද්‍යාව අනුව විශ්ලේෂණය කොට බැලීමේදී ද සත්වයා යනු නාමරූප සංකීර්ණයක සුසංයෝගී ක්‍රියාකාරිත්වයකි. නලකලාප සූත්‍රය අනුව කායික මානසික ක්‍රියාවලිය හෙවත් නාමරූප සහ විඤ්ඤාණ අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධ, අන්‍යෝන්‍ය පරායත්ත ක්‍රියාකාරිත්වයක් සහිත අංශ ද්වයක් ලෙස විග්‍රහ කෙරෙයි. ''සෙය්‍යථාපි ආවුසො, ද්වෙ නළකලාපියො අඤ්ඤමඤ්ඤං නිස්සාය තිට්ඨෙය්‍යුං, එවමෙව බො ආවුසො, නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං...''(සංයුත්තනිකාය 2, 2006: 180). විසුද්ධිමග්ගය අනුව සත්වයාගේ භෞතික පදනම රූප ලෙසත් මානසික පදනම නාම ලෙසත් විග්‍රහ කෙරෙයි. පංචස්කන්ධ විග්‍රහය, අටලොස් ධාතු විග්‍රහය, ෂඩ් ආයතන විග්‍රහය ආදි විග්‍රහයන් තුළ පැහැදිලි කෙරෙන්නේ එයයි.

පෘථිවියෙහි මානව සම්භවය සිදු වූ දා පටන් නූතන මිනිසා දක්වා අනාදිමත් කාලයක් තිස්සේ කායික මෙන් ම මානසික වශයෙන් ද පරිණාමය වෙමින් සංවර්ධනය වූ ක්‍රියාවලියක් බුදුදහමේ අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් හඳුනාගත හැකි ය. එසේ ම ස්ත්‍රී පුරුෂ භාවය මත සිදු වන කායික වෙනස්කම් සහ ඊට සාපේක්ෂව මානසික හා කායික ක්‍රියාවන් සිදු වන ආකාරයත්, ඉන්ද්‍රිය සංවේදනය, සංජානනය, පෞරුෂය ආදි මනෝවිද්‍යාත්මක ක්‍රියාවලීන් සඳහා කායික පදනම බලපාන ආකාරයත් බෞද්ධ ඉගැන්වීම්හි ඇතුළත් වේ.

**පර්යේෂණ ගැටලුව හා අරමුණ**

කෙසේ නමුත් මිනිස් චර්යාව කෙරෙහි බලපාන ජීවවිද්‍යාත්මක සාධක පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් තුළ බොහෝ විග්‍රහයන් ඇතුළත් වුවත් ඒ පිළිබඳව බෞද්ධ මනෝවිද්‍යාව විෂයයට අදාළ පර්යේෂණයන්හිදී එතරම් සැලකිල්ලක් දක්වා ඇති බවක් නොපෙනෙයි. විශේෂයෙන් ම සූත්‍ර පිටකයෙහි එන අග්ගඤ්ඤ සූත්‍රය, නිබ්බෙධික සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය ආදිය මෙහිලා වැදගත් මූලාශ්‍රයන් ලෙස අධ්‍යයනය කළ හැකි ය.

එමෙන් ම අභිධර්ම පිටකයෙහි සතර පරමාර්ථ යටතේ විග්‍රහ වන රූප පරමාර්ථය ඍජුව ම මිනිස් චර්යාව කෙරෙහි බලපාන ජීව විද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීමට යෝග්‍ය මූලාශ්‍රයකි. ඒ අනුව මිනිස් චර්යාව හා මානසික ක්‍රියාවලියෙහි කායික පදනම බෞද්ධ මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## සාහිත්‍ය විමර්ශනය

මිනිස් චර්යාවේ ජීවවිද්‍යාත්මක පදනම පිළිබඳව බටහිර මනෝවිද්‍යාව තුළ නිරන්තරයෙන් පර්යේෂණ සිදු වුව ද ඒ පිළිබඳව බෞද්ධ මනෝවිද්‍යාවේ න්‍යාය හා සංකල්ප පිළිබඳ මනෝවිද්‍යාත්මක හා තුලනාත්මක අධ්‍යයනයක් සිදු කෙරී ඇති බවක් දක්නට නොලැබෙයි. කෙසේ නමුත් මිනිසාගේ භෞතික පදනම පිළිබඳව බෞද්ධ විග්‍රහය පැහැදිලි කෙරෙන ශාස්ත්‍රීය කෘති බොහෝ ප්‍රමාණයක් දැකගත හැකි ය.

විශේෂයෙන් ම ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි (2006) 'බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය' තුළ පුද්ගලයා හා පෞරුෂය යටතේ පුද්ගලයා සකස්ව පවතින නාමරූප සංකීර්ණය පිළිබඳව යම් විග්‍රහයක් ඉදිරිපත් කරයි. එහිදී නාමරූප, ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්චසමුප්පාද, ආහාර ආදි විග්‍රහයන් ඇතුළත් වුව ද එය ජීවවිද්‍යාත්මක හෝ මනෝවිද්‍යාත්මක හෝ දෘෂ්ටියකින් කරන ලද අධ්‍යයනයක් ලෙස සැලකීම උහගට ය. එය හුදෙක් ම බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණයකි.

එමෙන් ම රේරුකානේ චන්දවිමල නාහිමි 'අභිධර්මයේ මූලික කරුණු' (1949) හා 'අභිධර්මාර්ථ සංග්‍රහය' (1956) ග්‍රන්ථ තුළ අභිධර්මයෙහි එන රූප පරමාර්ථය පැහැදිලි කරමින් මිනිසාගේ භෞතික පදනම පිළිබඳව පැහැදිලි විග්‍රහයක් ඉදිරිපත් කරයි. මිනිසාගේ භෞතික පදනම හා එය මානසික ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය පිළිබඳව යම් අවබෝධයක් ලැබීමට එම දැනුම උපයෝගි කර ගත හැකි ය. ඉන් අභිධර්මාර්ථ සංග්‍රහය ග්‍රන්ථය අනුරුද්ධාචාරීන්ගේ අභිධම්මත්ථසංගහය සිංහල පරිවර්තනය සහිතව කරන ලද සංස්කරණයකි. අභිධර්මයේ මූලික කරුණු ග්‍රන්ථය තුළ අභිධර්ම පිටකයේ ප්‍රධාන සංකල්ප පිළිබඳ සරල පැහැදිලි කිරීම් ඇතුළත් වන අතර අටවිසි රූප විග්‍රහය සරලව පැහැදිලි කරමින් මිනිස් ශරීරයේ භෞතික ක්‍රියාකාරිත්වය සාකච්ඡා කරයි.

මේ ආදි විග්‍රහයන් මගින් රූපය හෙවත් භෞතික කය මිනිස් චර්යාවන්ට ඍජු හෝ වක්‍රාකාරයෙන් බලපාන්නේ කෙසේ ද යන්න පිළිබඳ යම් යම් ශාස්ත්‍රීය පැහැදිලි කිරීම් පැවතිය ද මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් කරන ලද පර්යේෂණ හෝ ශාස්ත්‍රීය ලේඛන දුලබ වෙයි. එම රික්තය පූර්ණය සඳහා මෙම පර්යේෂණය මගින් අවධානයට ලක් කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයට අයත් ග්‍රන්ථ සන්ධාර අධ්‍යයන ක්‍රමවේදය අනුව සිදු කරන ලදී. පුස්තකාල පරිහරණය මෙන්ම අන්තර්ජාලය පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් ප්‍රස්තුතයට අදාළ දත්ත රැස් කර ගන්නා ලදී. රැස් කර ගන්නා ලද ගුණාත්මක දත්ත සන්ධාර විශ්ලේෂණය හා තේමා විශ්ලේෂණ ක්‍රමයන් අනුව විශ්ලේෂණය කොට නිගමනය ඉදිරිපත් කරන ලදී.

**දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව**

**සත්වයා සහ මානව සම්භවය**

පෘථිවියෙහි මානව සම්භවය පිළිබඳ බුදුදහම තුළ පැහැදිලි හා පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කෙරෙන ප්‍රධාන මූලාශ්‍රය ලෙස හඳුනාගත හැක්කේ දී.නි. අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවයි. අග්ග+ඤ+මුලය/ ආරම්භය/ සම්භවය දැනගැනීම (knowing the origin) යන අර්ථයෙන් එය භාවිතව ඇති බව පෙනෙයි. අග්ගඤ්ඤ සූත්‍රයෙහි නිදාන කථාව අනුව බ්‍රාහ්මණ කුලයෙන් පැමිණ පැවිදි වූ වාශිෂ්ඨ තෙරවරුන් සමග කරන ලද සාකච්ඡාවකදී බුදුන් වහන්සේ ලෝක සම්භවය හා පෘථිවිය මත පහළ වූ මුල් සත්වයන් මානවයා දක්වා පරිණාමය වූ ආකාරය ක්‍රමානුකූල පියවර ඔස්සේ පැහැදිලි කරති. එහි දැක්වෙන පරිදි මෙසේ ය.

''වාශිෂ්ඨයෙනි, දික් කලක් ඇවෑමෙන් කිසියම් සමයෙක මෙ ලොව වැනැසෙන්නේ ද, එසේ වූ කාලයක් වෙයි. එසේ ලොව නැසෙන කල්හි සත්වයෝ බෙහෙවින් ආභස්සර බඹලොවැ උපන්නාහු

වෙති. ඔහු එහි ධ්‍යානචිත්තබලයෙන් උපන්නෝ වෙති. ප්‍රීතිය ම ආහාර කොටැත්තාහු වෙති. තුමූ ම සිය සිරුරු පෙබෙන් බබළන්නාහු වෙති. අහසින් යන්නාහු වෙති. සිත්කලු වස්ත්‍රාභරණ හැඳ පැලැඳ සිටින්නාහු වෙති. එහි ඔහු ඉතා බොහෝ කලක් සිටිත්. වාශිෂ්ඨයෙනි, දික් කලක් ඇවෑමෙන් කිසි සමයෙක මෙ ලොව හටගන්නේ ද එසේ වූ කාලයක් වෙයි. ඒ ලොව හටගන්නා සමයෙහි බෙහෙවින් සත්හු ආභස්සර බ්‍රහ්ම නිකායයෙන් සැව මෙ මිනිසත් බවට පැමිණෙත්. ඔහු මෙහි ධ්‍යාන සිතින් උපන්නාහු ප්‍රීතිය ම ආහාර කොටැත්තාහු සිය සිරුරු පෙබෙන් බබළන්නාහු, අහසින් යන්නාහු, සිත්කලු වස්ත්‍රාභරණ ඇති වැ සිටින්නාහු ඉතා බොහෝ කලක් එසේ සිටිත්.'' (දීඝනිකාය 3, 2006: 145).

මෙම පැහැදිලි කිරීම අනුව මානවයා සංවර්ධනය වීමේ මූලික අවධි හඳුනාගත හැකිය. ලෝකය විනාශ වන සංවට්ටමාන කාලයේ ධ්‍යාන වඩා ධ්‍යානයෙන් නොපිරිහුණු සත්වයන් ආභස්සර බඹ ලොව උපන් අතර විවට්ටමාන කාලයෙහි පෘථිවි ආරම්භයේදී එහි පළමු සත්ව කණ්ඩායම වූයේ ද එසේ ආභස්සර බඹලොවින් පෘථිවියට පැමිණි පිරිසයි. ඔවුන් මිනිසුන් ලෙස සැලකිය නොහැකි නමුත් බෙහෙවින් ම මිනිසුන්ගේ ස්වරූපයට සමාන සත්ව පිරිසක් වූ බව පැහැදිලිව විග්‍රහ කෙරෙයි. කල්යත්ම පෘථිවිය මත ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය අනුව පැවැත්ම සඳහා යෝග්‍ය පරිදි ක්‍රමයෙන් ඔවුන් ශාරීරික හා මානසික වශයෙන් පරිණාමයට භාජනය වූ අතර නූතන මානවයා දක්වා එය සංවර්ධනය වූ ආකාරය දැකිය හැකි ය. මෙසේ ය.

අග්ගඤ්ඤ සූත්‍රයෙහි තවදුරටත් විස්තර වන පරිදි ලෝක ආරම්භයේදී ස්ත්‍රී පුරුෂ භාවයක් පවා ප්‍රකට නොවුණු සත්වයන් මිනිස් ස්වභාවය දක්වා පරිණාමය වීමේ මූලික පියවර වූයේ රස පොළව අනුභව කිරීමට ආරම්භ කිරීමයි. ඉන් පසු ක්‍රමයෙන් භූමි පප්පටක, බදාලතා වැල් වැනි රළු ආහාරවලට ඔවුන් යොමු වූ අතර සියුම් ශරීර ඝන ආහාරයන්ට හුරු වීම සඳහා අවශ්‍ය පරිදි භෞතිකව, ජීවවිද්‍යාත්මකව පරිණාමයට ලක් වීමෙන් මානව ශරීර වර්ධනය සිදු වූ බව පෙනෙයි. එමෙන් ම එම සියලු චර්යාවන් ඉගෙනීමේ ප්‍රධාන ක්‍රමවේදය කුතුහලය සහ අනුකරණය බව ඉන් හඳුනාගත හැකි ය.

කෙසේ නමුත් ඒ වන විටත් ඔවුන්ගේ ශරීරයන්හි මූලික ස්වරූපය හඳුනාගැනීමට හැකි තරම් සාධක මින් කියවෙයි. ඒ අනුව එම සත්වයන්ට ස්ත්‍රී පුරුෂ භාවය හෝ ප්‍රජනන ක්‍රියාවලියට හෝ ලිංගික චර්යාවන්ට අවශ්‍ය පරිදි ඉන්ද්‍රයයන් සංවර්ධනය වී නොමැති වුවත් ඇස, කණ, නාසය, දිව ආදි පංච ඉන්ද්‍රියයන්, අත්පා, ආහාර ජීර්ණ පද්ධතිය ඇතුලු බාහිර හා අභ්‍යන්තර ඉන්ද්‍රියන් පැවති බව ඉන් ගම්‍ය වෙයි. වර්තමානයේ පවා ළදරු වයසේ සිට සන ආහාර සඳහා හුරු කෙරෙන්නේ ක්‍රමානුකූල සංවර්ධනයකින් බව පැහැදිලි ය. මුල් මාස අටක් පමණ වන තෙක් මව් කිරෙන් පමණක් යැපෙන ළදරුවා ක්‍රමයෙන් කැඳ වර්ග, යුෂ වර්ග ආදියට ආහාර ජීර්ණ පද්ධතිය හුරු කර ගන්නා අතර බත් ආහාරයට ගැනීම ආරම්භ කරන්නේ වයස අවුරුද්දක් පමණ වර්ධනය වීමෙන් පසුවයි.

මෙසේ අග්ගඤ්ඤ සූත්‍රය අනුව පැහැදිලි කෙරෙන්නේ පෘථිවි ආරම්භයේ සිට වසර මිලියන ගණනාවක් තිස්සේ සිදු වූ පරිණාමීය ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස මානව වර්ගයා සංවර්ධනය වූ ආකාරය සහ පසුව ලිංගික චර්යාවන් ආරම්භ වීමෙන් පසු නවජයන් බිහි කිරීමේ ක්‍රියාවලිය ද සංවර්ධනය වූ ආකාරයයි.

**නාමරූප, ස්ඛන්ධ, ආයතන, ධාතු සහ කය මනස අතර සම්බන්ධය**

පුද්ගලයා නොහොත් සත්වයා සකස්වීම පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාවේ මූලික විග්‍රහය ලෙස නාමරූප විග්‍රහය දැක්විය හැකිය. කය හා මනස පිළිබඳ ලෝකයෙහි පවතින ඒකෙකවාදි හා ද්වෛතවාදි මත අතර බුදුදහම කය හා මනස අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ ක්‍රියාකාරිවයක් සහිත, එකිනෙකට පරායත්ත අංශ දෙකක් ලෙස විග්‍රහ කරයි. ''මෙම අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ ක්‍රියාකාරිත්වය තුළ ම පුද්ගලයා යන සම්මුතිය ඇති වෙයි'' (හෙට්ටිආරච්චි, 2006, පි. 24). එම ඉගැන්වීම වඩාත් පැහැදිලිව පෙන්වා දෙන ප්‍රධාන ඉගැන්වීම ලෙස නාමරූප විග්‍රහය දැක්විය හැකි ය. සත්වයාගේ ජීවවිද්‍යාත්මක පදනම රූප ලෙසත් මානසික පදනම නාම ලෙසත් විග්‍රහ කරන බෞද්ධ මනෝවිද්‍යාව පුද්ගල ක්‍රියාකාරිත්වය මෙම දෙකෙහි සමවායයෙන් යුතුව ක්‍රියාත්මක වන බව පෙන්වා දෙයි. ඒ බව සං.නි. නළකලාප සූත්‍රයෙහිදී බට මිටි දෙකෙහි උපමාව ආශ්‍රයෙන් පැහැදිලි කෙරෙයි (සංයුක්ත නිකාය 2, පි. 176).

නාමරූප හා එහි එකිනෙකට ප්‍රතිබද්ධ බව විසුද්ධිමාර්ග යෙහි 18 වන පරිච්ඡේදය වන දිට්ඨි විසුද්ධි නිර්දේශයෙහි මනාව පැහැදිලි කෙරෙයි. එහි දැක්වෙන පරිදි ''අරමුණට නැමෙන ස්වභාවය ඇත්තේ නාමයයි ද, රුප්පන (විකාරවීම්) ලක්ෂණය ඇත්තේ රූපයයි ද, සැකෙවින් නාම-රූප දෙක විනිශ්චය කෙරේ'' (සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය, 2015: පි. 963). ඒ අනුව සීත උෂ්ණාදි වශයෙන් විකාරයට පැමිණෙන හෙවත් රුප්පන ස්වභාවයෙන් යුක්ත බැවින් රූපයැයි හඳුන්වන්නේ ශරීරයේ භෞතික පැතිකඩ වන අතර අරමුණට නැමෙන ස්වභාව ඇති මානසික පැතිකඩ නාම ලෙස හඳුන්වන බව ඉන් පැහැදිලි කෙරෙයි.

දී.නි. සංගීති සූත්‍රයෙහි ඇතුළත් නාමරූප බෙදීම පිළිබඳ පැහැදිලි කරන එහි අටුවාව දක්වන ''තත්ථ නාමරූපදුකෙ නාමන්ති චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බානඤ්ච..... රූපන්ති චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං...'' (සංගීතිසුත්ත වණ්ණනා) පාඨය පරිදි නාම යනුවෙන් රූප නොවන ස්කන්ධ හතර වන වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන හතර සහ නිවනත් රූප ලෙස රූපය සකස් වීම සඳහා ප්‍රත්‍ය වන පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත සහ ඒවායේ උපාදාය රූපත් අදහස් කෙරෙන බව පැහැදිලි කෙරෙයි.

නාමරූපයන්හි ක්‍රියාකාරිත්වය තවදුරටත් විශ්ලේෂණය කෙරෙන ස්කන්ධ විභාගය තුළ පුද්ගලයාගේ සංකීර්ණ ජීවවිද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක පද්ධතීන්ගේ සංකලනය වඩාත් පුළුල්ව විග්‍රහ කෙරෙයි. එහි රූප, වේදනා, සංඥා, සංකාර හා විඤ්ඤාණ යන පහ පඤ්ච ස්කන්ධය ලෙස හඳුනාගැනෙයි. මෙම ස්කන්ධ යනු පස් වැදෑරුම් රාශී සමූහයක එකතුවකි. එමගින් පුද්ගලයා යන සම්මුතිය, ස්ව සංකල්පය, අත්තවාද උපාදානය ගොඩනැගෙන ආකාරය ද ඉතා පැහැදිලිව විග්‍රහ කොට තිබෙයි. මෙම පඤ්චස්කන්ධ විග්‍රහය පිළිබඳ ඉතා පැහැදිලි විග්‍රහයක් බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධිමග්ගයෙහි 14 වන පරිච්ඡේදය වන ස්කන්ධ නිර්දේශය තුළ විස්තර වෙයි (සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය, 2015, පි. 637-725).

පුද්ගලයාගේ බාහිරට නිරූපණය වන කායික පදනම රූප ස්ඛන්ධයයි. ඒ තුළ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන් මුල් කරගත් ශාරීරික අංගෝපාංගයන් අන්තර්ගත වෙයි. විඤ්ඤාණය සමග එක්ව වේදනා, සංඥා, සංකාර ස්ඛන්ධයන් ජනනය කිරීමට මූලිකව ම බලපානුයේ ද රූපයයි. වේදනා ස්ඛන්ධය මගින් නිරූපණය කරන්නේ පුද්ගලයාගේ වින්දන හැකියාවයි. පංචේන්ද්‍රියන් හරහා බාහිර පරිසරයෙන් උකහා ගන්නා උත්තේජයන් සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ ලෙස වින්දනය කරයි. උත්තේජිත විෂය අරමුණ සංජානනය කිරීමට ද පූර්ව වේදනාව ඇති වන බව බෞද්ධ විග්‍රහයයි.

''ඇස, කණ, නාසය ආදි ඉන්ද්‍රියයන් හරහා වින්දනය කරනු ලබන විෂය අරමුණු හැඳිනගැනීමේ සංජානන ශක්තිය සංඥා ස්ඛන්ධයෙහි ලා සැලකේ'' (පේමරතන හිමි, 2010, පි. 58). ''සඤ්ජානාති බො ආවුසො තස්මා සඤ්ඤාති වුච්චති'' යනුවෙන් මජ්ඣිම නිකායේ සඳහන් වන පරිදි නීල පීතාදි වශයෙන් අරමුණු සංජානනය කරන්නේ සංඥා නම් වෙයි (සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය, 2015, පි. 695). ''පුද්ගල මනසේ සංස්කරණ හා අභිසංස්කරණ හැකියාවත් ඒ හරහා සකස් කරගත් හුරු පුරුදු හා ප්‍රවණතා සමූහයත් සංස්කාර ස්ඛන්ධයෙන් අදහස් වේ'' (පේමරතන හිමි, 2010, පි. 59). සංස්කාරයන් කාය, වචී, මනෝ යන ආකාර තුනෙහි ම ක්‍රියාත්මක වෙයි. පුද්ගලයාගේ චර්යාවට බලපාන කායික වාචසික මානසික පුරුදු හා සකස් කිරීමේ මානසික හැකියාව සංස්කාර ස්ඛන්ධය මගින් නිරූපණය කෙරෙයි.

ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන් හරහා යම් වස්තු අරමුණක් ඇතුළු වීමේදී ඒ පිළිබඳව ඇති කරගන්නා දැනීම් මාත්‍රය නොහොත් සංවේදනයක් ඇති කර ගැනීම විඤ්ඤාණ ස්ඛන්ධය මගින් සිදු වෙයි. චක්ඛු විඤ්ඤාණය, සොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය හා මනො විඤ්ඤාණය වශයෙන් විඤ්ඤාණය සය ආකාර වෙයි.

චක්ඛුවිඤ්ඤාණ ආදි විඤ්ඤාණ පහ ක්‍රියාත්මක වීම සඳහා භෞතික පදනම වන රූපස්ඛන්ධයේ ක්‍රියාකාරිත්වය ප්‍රමුඛ අවශ්‍යතාවක් වන බව ආයතන හා අට්ඨාරසධාතු විග්‍රහයෙන් පැහැදිලි වෙයි.

විසුද්ධිමග්ගයෙහි ස්ඛන්ධ විභාගයට අනතුරුව දැක්වෙන ආයතන ධාතු නිර්දේශයෙහි (15 පරිච්ඡේදය) මිනිස් චර්යාව හා බැඳෙන අජ්ඣත්තික සහ බාහිර ආයතන දොළහක් දැක්වෙයි. චක්ඛු ආයතන, රූපායතන, සොතායතන, සද්දායතන, ඝාණායතන, ගන්ධායතන, ජිව්හායතන, රසායතන, කායායතන, ඵොට්ඨබ්බායතන, මනායතන, ධම්මායතන යැයි ආයතන දොළහකි (සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය, 2015, පි. 726). මෙම ආයතන විග්‍රහයෙහි මනායතනය සහ ධම්මායතනය හැරුණු කොට අනෙක් ආයතන දහය (10) ම පුද්ගලයාගේ චර්යාවට බලපාන ජීවවිද්‍යාත්මක ක්‍රියාවලිය පෙන්වා දෙමින් භෞතිකයට වැඩි නැඹුරුතාවක් දක්වා තිබෙන බව පැහැදිලි ය.

කෙසේ නමුත් මනායතනයේ ක්‍රියාකාරී දායකත්වයෙන් තොරව කිසිඳු භෞතික ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයක් අපේක්ෂා කළ නොහැකි බව අට්ඨාරස ධාතු විග්‍රහයෙන් පැහැදිලි කෙරෙයි. විසුද්ධි මග්ගයෙහි 15 වන පරිච්ඡේදය වන ආයතන ධාතු නිර්දේශයෙහි මෙම අට්ඨාරස ධාතු විග්‍රහය පිළිබඳ පුළුල් පැහැදිලි කිරීමක් දැක්වෙයි. ''අර්ථ වශයෙන් මෙසේ යි. අරමුණු රස විඳින්නේ හෙවත් රූපාලම්බනය ප්‍රකට කොට දක්නේ චක්ඛු නම. ළෙහි වන් බව ප්‍රකට කරන්නේ රූප නම. ඒ චක්ඛුහුගේ විඤ්ඤාණය - චක්ඛු විඤ්ඤාණය යැ'' (සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය, 2015, පිටුව 733) ආදි ලෙසින් එය විග්‍රහ කෙරෙයි. ඉන් ඉස්මතු කෙරෙන ප්‍රධාන කරුණ නම් කායික සහ මානසික පදනම අන්‍යොන්‍ය ප්‍රතිබද්ධව, අන්‍යොන්‍ය පරායත්තව ක්‍රියාත්මක වන බවයි. එනම්, නාමරූප නොහොත් කාය චිත්තයන්ට හුදෙකලා පැවැත්මක් නොවන බවයි. සං.නි. ඉසිදත්ත සූත්‍රයෙහි (සංයුත්තනිකාය 4: 524) අටළොස් ධාතු බෙදීම දක්වා ඇත්තේ මෙසේ ය.

| | | |
|---|---|---|
| චක්ඛු ධාතු | රූප ධාතු | චක්ඛු විඤ්ඤාණ ධාතු |
| සොත ධාතු | සද්ද ධාතු | සොත විඤ්ඤාණ ධාතු |
| ඝාණ ධාතු | ගන්ධ ධාතු | ඝාණ විඤ්ඤාණ ධාතු |
| ජිව්හා ධාතු | රස ධාතු | ජිව්හා විඤ්ඤාණ ධාතු |

කාය ධාතු ඵොට්ඨබ්බ ධාතු කාය විඤ්ඤාණ ධාතු

මනො ධාතු ධම්ම ධාතු මනො විඤ්ඤාණ ධාතු

මෙසේ ඉන්ද්‍රිය හයත් ඉන්ද්‍රිය හයට ගෝචර වන රූපාදි අරමුණු හයත් ඉන්ද්‍රිය හා අරමුණ ගැටීමෙන් ඇති වන දැනීම හෙවත් චක්ඛු විඤ්ඤාණාදි විඤ්ඤාණත් එක් කොට ගැනීමෙන් අට්ඨාරස ධාතු විශ්ලේෂණය කෙරෙයි. මෙම විග්‍රහය තුළ මානසික පදනමෙහි ක්‍රියාකාරිත්වය භෞතිකයට සාපේක්ෂව වඩාත් පුළුල් ලෙස විග්‍රහ කෙරෙන බව පැහැදිලි ය. මෙම සියලු ම ඉගැන්වීම්වලින් පැහැදිලි කෙරෙන මූලික කරුණ නම් කය සහ මනස ක්‍රියාකාරිත්වයන් දෙකක් සහිත වන නමුත් ඒවා එකිනෙක වෙන් කොට මිනිස් චර්යාව පිළිබඳ පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කළ නොහැකි බවයි.

**රූප පරමාර්ථය සහ සත්ව ක්‍රියාකාරිත්වය විෂයෙහි රූපයෙහි බලපෑම**

මිනිස් චර්යාවට පාදක වන කායික හෙවත් ජීවවිද්‍යාත්මක පදනම ඉතා ගැඹුරින් හා පුළුල් ලෙස විග්‍රහ කෙරෙන වැදගත් ම මූලාශ්‍රය ලෙස හඳුන්වා දිය හැක්කේ අභිධර්ම පිටකයෙහි රූප කාණ්ඩයෙහි ඇතුළත් විවරණය යි. චිත්ත, චෛතසික යන මානසික පදාර්ථයන්ට අදාළ පරමාර්ථ ධර්ම විග්‍රහයෙන් පසු රූප සංග්‍රහ විභාගය ඇතුළත් වේ.

අභිධර්ම විග්‍රහයට අනුව රූප යනු ඉතා සංකීර්ණ අර්ථයකින් භාවිත වන පදයකි. ඒ අනුව ඇසත් ඇසට පෙනෙන්නා වූ සියලු රූපයනුත්, කනත් කනට ඇසෙන්නා වූ සියලු ශබ්දයනුත්, නාසයත් නාසයෙන් ආඝ්‍රාණය කරනු ලබන්නා වූ සියලු ගන්ධයත්, දිවත් දිවෙන් දැන විඳින්නා වූ සියලු රසයනුත්, කයත් කයින් වින්දනය කරන්නා වූ සියලු ස්පර්ශයනුත් යනාදි වශයෙන් යම් පමණ වස්තු, ධාතු සමූහයක් වේ ද එම සියල්ලක් ම රූප ගණයට අයත් වෙයි. මන්ද යත් ඒ සියල්ලක් ම හේතු ප්‍රත්‍ය සමවායයෙන් හටගන්නා ශක්ති සමූහයන් වන අතර සීතෝෂ්ණාදි ප්‍රත්‍යයන් නිසා විපරීත භාවයට පත් වන බැවිනි.

රූප යනු කුමක්දැයි විස්තර කරන පරමත්ථදීපනී සංගහ ටීකාව එය දක්වන්නේ මෙසේය. ''රූපන්ති එත්ථ රුප්පතී'ති රූපං. සීතුණ්හාදීහි විරොධි පච්චයෙහි විසම පවත්ති වසෙන විකාරං ආපජ්ජති, තෙහි වා විකාරං ආපාදීයතී'ති අත්ථො.'' ඒ අනුව රුප්පන ස්වභාවයෙන් යුක්ත බැවින් රූප නම් වේ. රූපයෝ සීතලෙන් රුප්පනය වෙයි. උෂ්ණයෙන් රුප්පනය වෙයි. කිපේය, විරුද්ධ වේය, විරුද්ධ ප්‍රත්‍යය විසින් පෙළීමට ලක්වේය, බිඳීමට ලක්වේය යන අර්ථයෙන් රූප නම් වෙයි. සරලව දැක්වීමේදී විවිධ භෞතික සාධකයන්ගේ බලපෑම නිසා පරිණාමයට ලක් වන, වෙනස් වීමට භාජනය වන පදාර්ථ රූප ගණයෙහි ලා සැලකෙයි.

රූප පරමාර්ථයෙහි විග්‍රහ වන රූප ගණනින් විසි අටකි (28). එම විසි අට අතුරින් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත රූප හතර මහා භූතරූප වශයෙනුත් අනෙක් විසි හතර (24) සතර මහා භූතයන් නිසා පවතින උපාදාය රූප වශයෙනුත් වර්ග කෙරෙයි. ''චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං'' (ධම්මසංගණිප්පකරණට්ඨ කථා, රූප කාණ්ඩ වණ්ණනා) යනුවෙන් දක්වා ඇති පරිදි සතර මහා භූතයෝ උපාදාය ඇසුරු කොට නොමිදී පවත්නා විසි හතර රූපයන් උපාදාය රූපයි. ඒවා,

- පසාද රූප (5)
- ගොචර රූප (4)
- භාවරූප (2)
- හදය වස්තු
- ජීවිතින්ද්‍රය
- කබලිංකාරාහාරය
- ආකාස ධාතුව
- විඤ්ඤත්ති රූප 2

- විකාර රූප 3
- ලක්ඛණ රූප 4

යනුවෙන් එකොළොස් ආකාරයකින් තවදුරටත් බෙදා විග්‍රහ කොට දැක්වෙයි.

**මහා භූතරූප සහ ශරීරයේ යාන්ත්‍රික ක්‍රියාවලිය**

අභිධර්ම විග්‍රහයට අනුව මහා භූතරූප හඳුන්වන්නේ ද්‍රව්‍යයන් නොව ශක්ති සමූහයන් ලෙස ය. ඒවා වේගයන් ය. ස්වභාවයන් ය. ඒවාට වෙන් වෙන් ව තනි තනිව පැවතිය නොහැකි අතර එක්ව උපදියි. යම් තැනෙක එක් මහාභූතයක් වේ නම් එහි අනෙක් තුන ද කිසියම් හෝ ප්‍රමාණයකින් පවතියි. පෘථිවියෙහි ද ජලයෙහි ද ගින්නෙහි ද සුළඟෙහි ද මෙම මහා භූතධාතූන් හතර ම එක්ව පවතියි. මෙහි පඨවි ධාතු යනු යම් වස්තුවක පවත්නා තද ගතියයි. අපගේ අතට ස්පර්ශ වන්නේ එම පඨවි ධාතුවයි. එම පඨවි ස්වභාවය ලෝකයේ ඇති වස්තු පුද්ගල ද්‍රව්‍ය සියල්ලට පොදු ය. රූප කලාප ඝණව පිහිටන කල්හි කර්කශ ගතිය ද, තද ගතිය ද, බර බව ද ප්‍රකට වේ. රූප කලාප ඝණ නොවී ආකාශ ධාතුව අධිකව පවතින කල්හි මොළොක් බව ද, සිනිඳු බව ද, සැහැල්ලු බව ද දැනෙන්නේ ය. මේ තද බවත් මොළොක් බවත් සැහැල්ලු බවත් පඨවි ධාතුම ය (රත්නපාල, 2004: 466).

ආපො ධාතු යනු දියර ස්වභාවය, වැගිරෙන ස්වභාවයයි. ජලයෙහි ආපෝ ස්වභාවය අධික වෙයි. ශරීරයේ ඇති පඨවිය එක් කොට තබන්නේ ආපෝ ධාතුව මගිනි. තේජෝ ධාතුව පුද්ගල ශරීරයෙහි පැවැත්ම සඳහාත් සක්‍රිය බව සඳහාත් දැඩිව බලපාන ධාතුවක් ලෙස සැලකිය හැකි ය. ආයු, උෂ්ම, විඤ්ඤාණ යන ශක්තීන් තුන අතුරින් සත්ව ශරීරයෙහි සජීවී බව පවත්වාගෙන යාමට ඍජුව ම උපකාරී වන ධාතුවක් ලෙස ද තේජෝ ධාතුව (උෂ්ම) සැලකෙයි. නව රූප කලාප නිෂ්පාදනය කරමින් සත්ව ශරීරය වැඩීමට පත් වන්නේ ද එම උෂ්මය පවතින තාක් පමණි. වස්තූන්ගේ සැලෙන, සෙලවෙන, පිම්බෙන, හැකිලෙන ස්වභාවයෙන් යුක්ත වන්නේ වායෝ ධාතුවයි. ශරීරයෙහි පිම්බුණු ස්වභාවය පවතින්නේ වායෝ ධාතුව හේතුවෙනි. පුද්ගලයා ඉදිරියට පසුපසට චලනය කරන්නේ වායෝ ධාතුවයි (රත්නපාල, 2004: 469).

**භාවරූප සහ පුද්ගල චර්යාව**

ඉත්ථිභාව සහ පුරුෂභාව ලෙස භාව රූප දෙකකි. පුද්ගලයන් අතර ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය අනුව වෙනස ඇති කිරීමෙහිලා බලපාන්නා වූ රූප කලාපයන් වන්නේ භාවරූපයන් ය. සතර මහා භූතධාතූන් විසින් ඇතිකොට පවත්වාගෙන යනු ලබන ශරීරය තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් ලිංග ඉන්ද්‍රියේ සිට සියලු ම යාන්ත්‍රික ක්‍රියාවලිය සඳහා මෙම භාවරූපය පදනම් වෙයි. භාවරූප සහ එහි ක්‍රියාකාරිත්වය අභිධර්මාර්ථ ප්‍රදීපිකාවෙහි මෙසේ විස්තර වෙයි.

''මේ භාවරූප දෙක කර්මයෙන් ම හටගන්නා රූපයෝ්යි. එකම සන්තානයෙහි එකවර මේ භාවරූප දෙක ම නොපවත්නේ ය. ප්‍රතිසන්ධික්ෂණයේදී හෙවත් ප්‍රතිසන්ධි චිත්තයාගේ උප්පාදක්ෂණයේදී ම භාවරූප පහළ වේ. එතැන් සිට පටිසන්ධි චිත්තයාගේ ඨිති භංග යන අවස්ථා දෙක්හි ද, අනතුරුව පහළ වන්නාවූ සියලුම චිත්තයන්ගේ උප්පාද, ඨිති, භංග යන අවස්ථාවන්හිදී ද, ප්‍රතිසන්ධි බීජයෙහි පහළ වූ භාවරූප පරම්පරා වශයෙන් ජනක කර්ම ශක්තිය හේතු කොටගෙන පහළ වෙමින් ලිංග, නිමිත්ත, කෘත්‍යය, ආකල්ප ආදි වශයෙන් පසු පසුව ප්‍රකට වන්නේ ය.'' (රත්නපාල, 2004: 483).

මෙම පැහැදිලි කිරීම අනුව භාව රූප දෙක උපදින්නේ පළමුවෙන් ඇති වන ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව උපදින භවංග සිතෙහි පටන් වන අතර එක් පුද්ගලයෙකු තුළ ක්‍රියාත්මක වන්නේ එක් භාවරූපයක් පමණි. ''නපුංසකයන්ට පටිසන්ධික්ෂණයෙහිදී මේ භාවරූප පහළ නොවන අතර උභතෝබ්‍යඤ්ජකයාට පළමුව එක් ලිංගාදියක් පමණක් ඇතිව පසුව එය අතුරුදහන් වී අන්‍ය ලිංගාදිය පහළ වෙයි'' (රත්නපාල, 2004: 484). එමෙන් ම භාවරූපයන් කර්ම ශක්තියෙහි බලපෑමෙන් ම හටගන්නා රූපයෝ ය. ඒ අනුව ස්ත්‍රී හෝ පුරුෂ ශරීරයක් තුළ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය එම භාවරූප කලාපයන් මගින් මෙහෙයවනු ලබන අතර ලිංග, නිමිත්ත, කුත්ත (කෘත්‍ය), ආකප්ප, ඉත්ථිත්ථ/පුරිසත්ථ සහ භාව (ඉත්ථිභාව/ පුරිසභාව) යනුවෙන් එම ස්වභාවයන් ප්‍රකට කරන ලක්ෂණ හයක් විවරණය කෙරෙයි (චන්ද්‍රවිමල නාහිමි, 1949: 134).

■ **ලිංග** - ඉත්ථි ලිංගය හා පුරුෂ ලිංග ලෙස ලිංග දෙකකි. ලිංග යනු ප්‍රධානාංග වූ මහ සටහනයි (චන්දවිමල නාහිමි, 1949: 135). රාගය ඇති කරන ස්ත්‍රී අවයවය ඉත්ථි ලිංග වන අතර ජාත අංගය වන පුරුෂ අවයවය පුරුෂ ලිංගයයි. එනම්, ලිංගික ඉන්ද්‍රිය සකස් කිරීම, ලිංගික ආශාවන් ඇති කිරීම හා ලිංගික චර්යාවන් ඇති කිරීමේ ජීවවිද්‍යාත්මක ක්‍රියාවලිය මෙම භාවරූපයන්ගේ බලපෑම අනුව සිදුවෙයි.

■ **නිමිත්ත** - නිමිත්ත යනු ප්‍රත්‍යංග වූ කුඩා සටහන් ය (චන්දවිමල නාහිමි, 1949: 135). භාවරූප අනුව ස්ත්‍රී හෝ පුරුෂ ශරීරයේ සියලු අංගෝපාංග සකස් වෙයි. වටවූ පුළුල් වූ උකුළ, මෘදු අත් පා ආදිය ඉත්ථි නිමිත්තට අදාළ සටහන් ය. තවද, දිගු හිසකේ හටගැනීම, හදයෙහි ලොම් නැති බව, රැවුල නැති බව, මිහිරි කටහඬ ආදිය ඉත්ථි නිමිත්ත අනුව සකස් වෙයි. පුරුෂයන්ගේ අත්පා, මුහුණු ආදිය මහත් වන අතර දැළි රැවුල් හා බහුල වූ ශරීර රෝම ආදිය ඇත (රත්නපාල, 2004: 482-483). කටහඬ ගොරෝසු වෙයි. මෙම ලක්ෂණ ඇති කිරීමෙහි ලා බලපාන්නේ ද එම භාවරූපයයි.

■ **කෘත්‍යය** - කෘත්‍යය යනු ක්‍රියාවන්, ක්‍රීඩා ලීලාදි විලාසයන් ය. ඉත්ථිභාව රූපය අනුව ස්ත්‍රීහු මැහුම්, ගෙතුම්, පිසීම් ආදි චර්යාවන් හා ස්ත්‍රීන්ට යෝග්‍ය චර්යාවන් දක්වති. කය වෙහෙසා කරන කැපීම්, කෙටීම්, බර ඉසිලීම් ආදි කෘත්‍යයන් ස්ත්‍රීන් තුළ හීන වන අතර ඒවා පුරුෂ කෘත්‍යයන් වෙයි. ක්‍රීඩාවන් ද ස්ත්‍රී හෝ පුරුෂ භාව රූප අනුව වෙනස් වෙයි.

■ **ආකප්ප** - පරමත්ථදීපනී නම් වූ අභිධර්මාර්ථ සංග්‍රහ වර්ණනාව අනුව ආකප්ප යනුවෙන් දැක්වෙන්නේ ගමනාදියයි (චන්දවිමල නාහිමි, 1949: 135). ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ ගමන් කරන, ආහාර ගන්නා, ක්‍රියාවන් කරනා සහ ඉරියව් ආදිය පවත්වන්නා වූ ආකාරයන් වෙනස් වෙයි. ඒවා ද භාවරූපයන් අනුව සකස් වෙයි.

මේ අනුව ඉත්ථි හෝ පුරුෂ භාවරූප අනුව පුද්ගලයාගේ කායික ලක්ෂණ මෙන් ම චර්යාවන් ද විවිධත්වයෙන් යුතුව සංවර්ධනය වන ආකාරය මෙම රූප පරමාර්ථය පිළිබඳ අභිධර්ම විග්‍රහයෙන් පැහැදිලි කෙරෙයි. තවද, පුද්ගලයාගේ මානසික ලක්ෂණයන් සහ ඒ ආශ්‍රිත

චර්යාවන් සඳහා ද මෙම භාවරූපයන් පදනම් වේ. එනම්, ස්ත්‍රීන් හා පුරුෂයන් සිදු කරන කායික, වාචසික චර්යාවන් සඳහා මානසික වශයෙන් අභිප්‍රේරණය කිරීම සඳහා ද මෙම භාවරූපයන් හේතු වන බව ඉත්ථි තණ්හා, පුරිස තණ්හා වැනි විග්‍රහයන්ගෙන් පැහැදිලි වේ (චන්දවිමල නාහිමි, 1949: 133).

මෙසේ පහළ වන භාවරූප කලාපයන් ශරීරයෙහි සෑම ඉන්ද්‍රියක්, අංගයක් පාසා ම පැතිර පවතිමින් ක්‍රියාත්මක වෙයි (රත්නපාල, 2004: 484). වැදගත් ම කරුණ නම් පුද්ගලයාගේ මානසික තත්වයන්, සිතුවිලි, ආකල්ප, චර්යාවන් ආදි සියලු ම ඉච්ඡානුක හා අනිච්ඡානුක තත්වයන් සඳහා භාවරූප පදනම් කරගත් ජීවවිද්‍යාත්මක ක්‍රියාවලිය තුළින් ප්‍රබල බලපෑමක් සිදු වන බවයි. ඒ අනුව ස්ත්‍රීපුරුෂ පෞරුෂ ලක්ෂණ හා චර්යාවන්හි මූලික ජීවවිද්‍යාත්මක පදනම ද අටවිසි රූප අතර භාවරූප වන බවත් සතර මහා භූතරූප ආදි අනෙකුත් රූපයන් ද ඊට අනුව ක්‍රියාත්මක වන බවත් පැහැදිලිව දැක්විය හැකි ය.

**පසාද රූප, ගෝචර රූප සහ ඉන්ද්‍රිය සංජානනය**

බාහිර හෝ අභ්‍යන්තර පරිසරයෙන් ඉන්ද්‍රිය අරමුණු ලබා ගැනීම හා හඳුනාගැනීමේ ක්‍රියාවලිය හෙවත් සංවේදනය හා සංජානන ක්‍රියාවලියෙහි ජීවවිද්‍යාත්මක ක්‍රියාවලිය විවරණය කිරීම රූප විග්‍රහය යටතේ එන මෙම ප්‍රසාද රූප සහ ගෝචර රූප පිළිබඳ විග්‍රහයෙන් සිදු කෙරෙයි. සජීවී සත්වයෝ ක්ෂණයක් පාසා ඉන්ද්‍රියන් හරහා අරමුණු ලබා ගැනීමත් අරමුණු රස විඳීමත් සිදු කරති. මෙහිදී විශේෂයෙන් ම මිනිස් චර්යාවට බලපාන ඉන්ද්‍රිය සංජානනයෙහි කායික පදනම සංක්ෂිප්තයෙන් සාකච්ඡා කෙරෙයි.

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය යන පඤ්ච ඉන්ද්‍රියයන්ට සම්බන්ධ පසාද (පාලි - පසාද, සංස්කෘත - ප්‍රසාද) රූප පහක් වෙයි.

- චක්ඛුප්පසාද රූපය
- සොතප්පසාද රූපය
- ඝාණප්පසාද රූපය
- ජිව්හාප්පසාද රූපය
- කායප්පසාද රූපය යනු එම පහයි.

**චක්ඛුප්පසාද රූපය**

රූප දැකීමේ ක්‍රියාවලිය සම්බන්ධ ඉන්ද්‍රිය වන චක්ෂුව හෙවත් ඇස ඉතා සංකීර්ණ ව්‍යූහයකින් යුතු ඉන්ද්‍රියක් ලෙස අභිධර්මයෙහි පෙන්වා දෙයි. බුද්ධ චක්ඛු, දිබ්බ චක්ඛු ආදි විවිධ චක්ෂුසයන් ධර්මයෙහි විග්‍රහ වුව ද රූප දැකීමට උපකාර වන්නේ මාංශ චක්ෂුසය හෙවත් මසැසයි. එම මාංශ චක්ඛුව ද නැවත සසම්භාර චක්ඛු සහ ප්‍රසාද චක්ඛු ලෙස ආකාර දෙකක් හෙවත් ව්‍යූහ සහ ක්‍රියාකාරිත්වයන් දෙකක් අනුව දැකගත හැකි ය. හිස්කබලට කිඳා බැස ඇති අක්ෂි කුහරයෙහි පිහිටි මාංශ පිණ්ඩයක් බඳු මාංශ චක්ඛුවෙහි ව්‍යූහය සසම්භාර චක්ඛු ලෙස හැඳින්වෙන අතර එය රූප සම්භාර දහහතරක (14) ඒකරාශිත්වයෙන් සකස්ව පවතින බව පැහැදිලි කෙරෙයි.

| | | | |
|---|---|---|---|
| 1. පඨවි | 5. වණ්ණ | 9. සම්භව | 13. කාය පසාද |
| 2. ආපෝ | 6. ගන්ධ | 10. සණ්ඨාන | 14. චක්ඛු පසාද |
| 3. තේජෝ | 7. රස | 11. ජීවිත | |
| 4. වායෝ | 8. ඕජා | 12. භාව | |

යනුවෙන් දැක්වෙන්නේ එම තුදුස් ආකාර ව්‍යූහයන් ය. එහි ද කර්මජ රූප, චිත්තජ රූප, උතුජ රූප, ආහාරජ රූප ලෙස ගත් කල්හි සතර මහා භූතරූප සහ වණ්ණ, ගන්ධ, රස, ඕජා, සම්භව, සණ්ඨාන යන දහය හතලිහක් වන අතර කාය පසාද, චක්ඛු පසාද, ජීවිත, භාව රූප සමග සම්පූර්ණ සසම්භාර චක්ඛුව රූප ව්‍යූහයන් හතලිස් හතරකින් (44) සමන්විත වෙයි. අභිධර්මාර්ථ ප්‍රදීපිකාවෙහි චක්ඛුප්පසාද රූපය මෙසේ දක්වා ඇත.

''සසම්භාර චක්ඛුව ඇසුරු කොට ගෙන පවත්නා දෘෂ්ටි මණ්ඩලයෙහි සිව් සතකින් යුක්ත වූ එක්තරා කුඩා ප්‍රදේශයෙක්හි, කර්මයෙන් හටගත්තා වූ රූප කලාපයන්ට ඇතුළත්ව, ඉදිරියෙහි ඇති රූපයන්ගේ ඡායාව වැද ගැනීමට සමත් වන යම් ඔපයක් වේ ද එයට චක්ඛුප්පසාද යැයි කියනු ලැබේ. චක්ඛුප්පසාද සහිත වූ රූප කලාප සමූහය ප්‍රමාණයෙන් උකුණු හිසකට සමාන කර තිබේ. මතු මත්තෙහි තබන ලද පුළුන් පෙද සතෙක්හි වත් කරන ලද තෙල් බිඳක් සේ දෘෂ්ටි මණ්ඩලයෙහි පිහිටි මෙම කුඩා ප්‍රදේශයෙහි ඇත්තා වූ පටල හතක පැතිර පවත්නා වූ මෙම චක්ඛුප්පසාද රූපයෝ එහිම පැතිර සිටි

පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත ධාතූන් විසින් උවටැන් කරන ලදුව, වණ්ණ, ගන්ධ, රස, ඕජාවන් විසින් පිරිවරණ ලදුව, ඍතු, චිත්ත, ආහාර විසින් උපස්ථම්භනය කරන ලදුව, ජීවිතින්ද්‍රිය විසින් රක්නා ලදුව, චක්ඛු විඤ්ඤාණය සිත් දෙකට වස්තු භාවය ද, ආවජ්ජන, සම්පටිච්ඡන, සන්තීරණ, ජවන, තදාලම්භනයන්ට ද්වාර භාවය ද සිද්ධ කරමින් හටගන්නේ ය.'' (රත්නපාල, 2004: 471-472)

මෙම විග්‍රහය තුළ ඇසෙන් රූප දැකීම සම්බන්ධ සම්පූර්ණ ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක ක්‍රියාවලිය ඉතා පැහැදිලිව දක්වා ඇති බව පෙනේ. ඒ අනුව ඇසෙහි පිහිටි උකුණු හිසක් තරම් කුඩා වන චක්ඛු පසාදය පටල හතකින් යුක්ත වන බව දැක්වෙයි. ''අත්ථසාලිනී ආදි බොහෝ අභිධර්ම ග්‍රන්ථයන්ට අනුව එහි ප්‍රමාණය උකුණු හිසක් තරම් වන බව උපමා කොට දක්වන අතර කළු ඉංගිරියාව මැද සිවිහතක් තුළ පැතිර පවතින බව තවදුරටත් විග්‍රහ කෙරෙයි. පටිසම්භිදාමග්ගට්ඨකාථවෙහි දැක්වෙන්නේ මුං පියල්ලක් පමණ වන බවයි'' (චන්දවිමල නාහිමි, 1949: 123). එම චක්ඛු පසාදය තමා ඉදිරියෙහි ඇති රූපයන්හි ආලෝකය හෙවත් ඡායාව ඇද ගැනීමේ, ඇතුළු කර ගැනීමේ හැකියාව සහිත වූවකි. එසේ ඇතුළු කරගන්නා රූප පිළිබඳ ආලෝක කිරණ ශක්තියෙන් චක්ඛු විඤ්ඤාණය ඇති කරන අතර ඉන් පසු සම්පටිච්ඡන, සන්තීරණ, ජවන, තදාලම්භන යන ක්‍රියාවලීන් ද ජනිත කරවීමේ ශක්තියෙන් යුතු වෙයි. ඒ අනුව මෙය රූප දැකීම සම්බන්ධ ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් පැහැදිලි කෙරෙන විග්‍රහයක් ලෙස හඳුනාගත හැකි ය.

**සොතප්පසාද රූපය**

ශබ්ද ඇසීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ ජීවවිද්‍යාත්මක ව්‍යූහය සොතප්පසාදයයි. මෙය ද සසම්භාර සොතය සහ පසාද සොතය ලෙස දෙයාකාරයකින් දැක්වෙයි. සසම්භාර සොතය යනු ඇසීමේ ක්‍රියාවලියට උපකාර කරන්නා වූ කණෙහි බාහිර සහ පසුබිම ව්‍යූහයයි. එය අභිධර්මාර්ථ ප්‍රදීපිකාවෙහි මෙසේ විස්තර කෙරෙයි.

''සසම්භාර සෝත බිලය හෙවත් කන් සිදුර තුළ තඹවන් රෝමයෙන් ගැවසීගත් ඇඟිලි මුදුවකට බඳු සටහන් ඇති පෙදෙසෙහි සතර මහා භූතයන් විසින් උවටැන් කරන ලදුව, ඍතු චිත්ත ආහාරයන්

විසින් උපස්ථාන කරන ලදුව, ජීවිතින්ද්‍රය විසින් පාලනය කරන ලදුව, වර්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, සෝත විඤ්ඤාණාදි සිත්වලට වස්තු වන කර්මජ වූ සතර භූතයන්ගේ ඔපය හෙවත් ප්‍රසාදය සෝතප්පසාද රූපය නම් වේ.'' (රත්නපාල, 2004: 472-473).

ඒ අනුව සෝතප්පසාදය යනු කන් සිදුර තුළ, එනම් ඇතුළු කණෙහි පිහිටි මුදුවක් මෙන් ස්වරූපය සහිත සතර මහා භූත ධාතුන්ගේ හා අනෙකුත් රූප කලාපයන්ගේ සමූහනයෙන් සකස් වූ ව්‍යුහයකි. එය ශබ්ද පිළිබඳ දැනීම ඇති කිරීම නම් වූ සොත විඤ්ඤාණය ඇති කරන අතර එතැන් සිට සම්පටිච්ඡන, සන්තීරණ, ජවන, තදාලම්බන ආදි ලෙස ශබ්ද පිළිබඳ සංවේදනය හා සංජානනය ක්‍රියාවලිය සිදු කරයි.

**ඝාණප්පසාද රූපය**

ගඳ සුවඳ ආඝ්‍රාණය කිරීම හෙවත් ගන්ධය ගැටීමට හා ගැටන ගන්ධය හඳුනාගැනීමට යෝග්‍ය පරිදි හැඩගැසුණු රූපය ඝාණප්පසාදය නම් වෙයි. මෙය ද චක්ඛු පසාද, සොත පසාද මෙන් සසම්භාර ඝාණය සහ ප්‍රසාද ඝාණය යයි දෙයාකාර වෙයි. සසම්භාර ඝාණ යනුවෙන් හැඳින්වෙන්නේ ආස්වාස ප්‍රාස්වාසයට උපකාර කරන වාතය ඇතුළු කරගැනීමේ හැකියාව සහිත වන නාසය හෙවත් නාස් කුහරයයි.

''සසම්භාර ඝාණය හෙවත් නාසය තුළ එළු කුරයක සටහන් ඇති පෙදෙසෙහි පඨවි ආදි සතර මහා භූතයන් විසින් උවටැන් කරන ලදුව, ඍතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භනය කරන ලදුව, ජීවිතින්ද්‍රය විසින් පාලනය කරන ලදුව, වර්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, ඝාණ විඤ්ඤාණාදි සිත්වලට වස්තු වන කර්මජ වූ සතර භූතයන්ගේ ඔපය හෙවත් ප්‍රසාදය ඝාණප්පසාද රූප නම් වේ.'' (රත්නපාල, 2004: 473-474).

මෙහි දැක්වෙන පරිදි නාස් කුහරය තුළ එළු කුරයකට සමාන ස්වරූප ඇති ස්ථානයක ඝාණප්පසාදය හෙවත් ගන්ධය ග්‍රහණය කර ගැනීමට යෝග්‍ය රූප ව්‍යුහයන් පිහිටා ඇති අතර උක්ත පරිදි ම ඝාණ විඤ්ඤාණාදි ක්‍රියාවලිය සිදු කිරීමේ සමත් වෙයි.

**ජිව්හාප්පසාද රූපය**

ආහාර පානාදියෙහි රස දැනගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීමෙහිලා උපකාර වන්නේ ජිව්හා පසාද රූපයයි. එය පුද්ගලයාගේ මුඛයෙහි පිහිටි දිව ආශ්‍රය කරගෙන පිහිටා ඇත. රස ගැටීමට යෝග්‍ය වූ දිවෙහි පිහිටි ඔපය ලෙස එය හඳුන්වයි (චන්ද්‍රවිමල නාහිමි, 1949: 125). මෙහි ද ආහාර පාන ඇද ගැනීමට, සැපීමට, ගිලීමට උපකාර වන දිව සසම්භාර ජිව්හා ලෙස හැඳින්වෙයි.

''සසම්භාර ජිව්හය හෙවත් දිව මැද මතුපිට උපුල්පතෙක අගට බඳු සටහන් ඇති පෙදෙසෙහි පඨවි ආදි සතර මහා භූතයන් විසින් උවටැන් කරන ලදුව, ඍතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භනය කරන ලදුව, ජීවිතින්ද්‍රය විසින් පාලනය කරන ලදුව, වර්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, ජිව්හා විඤ්ඤාණාදි සිත්වලට වස්තු වන කර්මජ වූ සතර භූතයන්ගේ ඔපය හෙවත් ප්‍රසාදය ජිව්හප්පසාද රූප නම් වේ.'' (රත්නපාල, 2004: 474).

ඒ අනුව ජිව්හා පසාදය යනු දිව මැද පිහිටි නෙළුම් මල් පෙත්තක අග ස්වරූපය ඇති රූපයයි. එහි රසාංකුර පිහිටා ඇති අතර ආහාරපානාදිය එහි ගැටෙන කල්හි ජිව්හා විඤ්ඤාණය උපදී. ඉන්පසු රස සංජානන ක්‍රියාවලිය සිදු වෙයි.

**කායප්පසාද රූපය**

කයෙහි ගැටෙන, ස්පර්ශ වන දෙය හඳුනාගැනීමේ ශක්තියෙන් යුතු වන්නේ කායප්පසාද රූපයයි. මෙය ද සසම්භාර කාය සහ පසාද කාය ලෙස දෙයාකාර වන අතර සමස්ත ශරීරය සසම්භාර කාය ලෙස හඳුන්වයි.

''සසම්භාර කයෙහි හෙවත් ශරීරයෙහි කර්මජ තේජෝ ධාතු නොහොත් ජඨරාග්නිය පවත්නා ස්ථානය හා කෙස් ලොම් නියඅග සහ වියලි සම ද හැර සෙසු සියලු ම ශරීරයෙහි කපු පුළුන් පෙදක වත්කළ තලතෙලක් සේ පැතිර පවත්නා වූ ද, පඨවි ආදි සතර මහා භූතයන් විසින් උවටැන් කරන ලදුව, ඍතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භනය කරන ලදුව, ජීවිතින්ද්‍රය විසින් පාලනය කරන ලදුව,

වර්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, කාය විඤ්ඤාණාදි සිත්වලට වස්තු වන කර්මජ වූ සතර භූතයන්ගේ ඔපය හෙවත් ප්‍රසාදය කායප්පසාද රූප නම් වේ.'' (රත්නපාල, 2004: 475).

ඒ අනුව කායප්පසාදය සමස්ත ශරීරය පුරා ම විහිදී සිටින රූපයකි. එසේ වුවත් කායප්පසාදය නොපිහිටන ස්ථාන කිහිපයක් දක්වා තිබීම ද විශේෂ ය. කර්මජ තේජෝ ධාතු පවතින ස්ථානය, කෙස්, ලොම්, නිය අග සහ මැරුණු හෝ වියලුණු සම මත කායප්පසාදය නොපිහිටයි. අනෙක් සියලු කයෙහි ස්පර්ශය හඳුනාගැනීමේ ශක්තිය සහිත වෙයි. එමෙන් ම ස්පර්ශයට ලක්වන භූතධාතු තුනක් ද දක්වා ඇත. එනම්, පඨවි, තෙජෝ, වායො යන භූත ධාතු ආශ්‍රය කරගත් යම් රූපයක් කායප්පසාදයෙහි ගැටයි නම් එවිට කාය විඤ්ඤාණාදි ක්‍රියාවලිය සිදු වෙමින් ස්පර්ශය සංජානනය කරයි.

**සංවේදනයට හේතු වන ගෝචර රූප**

පංච ඉන්ද්‍රියයන් හා ගැටෙන ස්පර්ශ වන මෙන් ම චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ සහ කාය විඤ්ඤාණ යන පඤ්ච විඤ්ඤාණයන්ට විෂය වන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන රූපයන් ගෝචර රූප හෙවත් විෂය රූප ලෙස හඳුන්වයි.

**රූප**

මෙහි රූප යනුවෙන් හඳුන්වනුයේ චක්ඛුප්පසාදයෙහි ගැටෙන, චක්ඛුප්පසාදයට හසු වන රූපයන්හි පවතින පැහැය හෙවත් ආලෝකයයි. ''චක්ෂුර් විඤ්ඤාණයට ගෝචර වන හෙවත් ඇසින් දැක්ක යුතු වූ, සතර මහා භූතයන් නිසා පවත්නා වූ, උපාදාය රූපයක් වූ, නීල පීත ලෝහිතාදි වශයෙන් ප්‍රභේද ඇත්තා වූ වර්ණය හෙවත් පැහැය රූපය නම් වේ'' (රත්නපාල, 2004: 476) යනුවෙන් එය දක්වා ඇත. චක්ඛුප්පසාදයට හඳුනාගත හැකි වන්නේ රූපයන්හි පවතින පැහැයයි. එය ආලෝකය, වර්ණය, ඡායාව ලෙස ද දැක්විය හැකි ය. බාහිර පරිසරයෙහි පවත්නා වූ රූපාලම්භනයක හෙවත් වර්ණයාගේ ඡායාව පමණක් චක්ඛුප්පසාදයෙහි ගැටෙයි. රූපය ගැටීමක් නොවෙයි.

ඇතැම් රූපයන්හි වර්ණ ධාතු ඉතා දුබල වන අතර ඇතැම් වර්ණ ධාතු ඉතා දීප්තිමත් ය. දුබල වූ ඡායා ඇති රූපයන් චක්ඛුප්පසාදයෙහි ද නොගැටන අවස්ථා වෙයි. නිදසුනක් ලෙස සුළඟෙහි ද වර්ණ ඇතත් එය ඇසෙහි නොගැටෙයි. එමෙන් ම වර්ණයන් චක්ඛුප්පසාදයෙහි ගැටෙන ආකාරය අනුව දුර සිට බලන කල්හි එක් ආකාරයකිනුත් ලඟ සිට බලන කල්හි තවත් ආකාරයකිනුත් ආලෝකය ප්‍රබලව ඇති කල්හි එක් ආකාරයකිනුත් ආලෝකය මද කල්හි තවත් ආකාරයකිනුත් යනාදි වශයෙන් එක ම වස්තුව විවිධ ආකාරයෙන් පෙනෙයි. එබැවින් වස්තුවක සැබෑ ස්වරූපය හෝ වර්ණය මසැසින් දැකීම අසීරුය (රත්නපාල, 2004: 476-477).

**සද්ද (ශබ්ද)**

කණෙහි පිහිටි සොතප්පසාදයෙහි ගැටීමෙන් සොත විඤ්ඤාණය ඇති කරන්නේ ශබ්දයයි. මෙය සොතප්පසාදයෙහි ගැටීම ලක්ෂණ කොට ඇත. අටවිසි රූප අතර ශබ්දය ද රූපයක් ලෙස දක්වා ඇත්තේ සතර මහා භූත රූපයන් නිසා, උපාදාය රූපයක් ලෙස හටගන්නා බැවිනි. ශබ්ද රූපයන් තනි තනිව හට ගැනීමක් නොවන අතර සැම විට ම රූප කලාපයන්ට ඇතුළත්ව, රූප කලාපයන් එකිනෙක ගැටීමෙන් හා වෙන් වීමේදී ශබ්දය ඇති වෙයි. ඒ අනුව ශබ්දය ද සතර මහා භූතයන් උපාදාය කොට ඇති වන රූපයකි.

**ගන්ධ**

නාසය තුළ පිහිටි ඝාණප්පසාදයෙහි ගැටීමෙන් ඝාණ විඤ්ඤාණය ඉපිදවීමට සමත් වන්නේ ගන්ධයයි. එය ද සතර මහා භූත ධාතූන් නිසා හටගන්නා බැවින් උපාදාය රූපයක් ලෙස දැක්වෙයි. ගන්ධය සැම රූප කලාපයක ම පවතින චතුර් ලක්ෂණ අතුරින් එකක් ද වෙයි. ගන්ධාධික රූප කලාප හාත්පස පැතිරෙන අතර වායුව සමග සම්මිශ්‍රිතව නාසිකා කුහරයට පැමිණ ඝාණප්පසාදයෙහි ගැටී ඝාණ විඤ්ඤාණය ඇති කරයි.

## රස

ජිව්හා විඤ්ඤාණයට ගෝචර වන සහ ජිව්හා විඤ්ඤාණයෙන් වින්දනය කරන උපාදාය රූපය රසයයි. ආහාර පානයෙහි ඇති උණුසුම් සිසිල් බව ආදි වෙනත් අරමුණු ගෝචර වන්නේ කායප්පසාදයටයි. දිවෙහි පුරා ම කායප්පසාදය ද පිහිටා ඇත. ජිව්හාප්පසාදය මගින් දිවෙහි තැවරුණු දෙයෙහි රස පමණක් දැන ගැනීම හෙවත් ජිව්හා විඤ්ඤාණය ඇති කිරීම සිදු වෙයි. රස රූපයෙහි මධුර, තිත්ත, ඇඹුල් ආදි විවිධ ප්‍රභේද ඇත (රත්නපාල, 2004: 480).

## පොට්ඨබ්බ

කායප්පසාදය හා ගැටීමෙන් කාය විඤ්ඤාණයට ගෝචර වන්නේ පොට්ඨබ්බයයි. එය පඨවි, තේජො, වායෝ යන භූත රූප උපාදාය කර ගනිමින් ඇති වන හා පවතින බැවින් උපාදාය රූපයකි. එසේ නමුත් පොට්ඨබ්බය ආපෝධාතු වජ්ජිත (බැහැර) රූපයක් ලෙස දැක්වෙයි. ''අපොධාතු විවජ්ජිතං භූතත්තය සංඛාතං'' (චන්දවිමල නාහිමි, 2016: 90) යනුවෙන් එය දැක්වෙයි. ආපෝ ධාතුව සියුම් වන බැවින් ද ඇතුළට ඇද ගන්නා ස්වභාව ඇති බැවින් ද කිසිවක් හා නොගැටන බවත් ආපො ගුණය අධික ජලය ස්පර්ශ කරන කල්හි කායප්පසාදය හා ගැටෙන්නේ එහි ඇති පඨවි, තේජො හා වායෝ ස්වභාවය බවත් අභිධර්මයෙහි විග්‍රහ කෙරෙයි.

ඒ අනුව සමස්ත ශරීරය පුරා පැතිර පවතින කායප්පසාදයෙහි ගැටෙමින් කාය විඤ්ඤාණය ඇති කරන්නේ පඨවි, තේජො සහ වායෝ ධාතූන් පමණි. පඨවි ධාතුව අනුව තද බව හා සැහැල්ලු බවත්, තේජො ධාතුව අනුව සීත හෝ උණුසුම් බවත්, වායො ධාතුව අනුව සැලෙන, නලියන, පිම්බෙන, හැකිලෙන බවත් දැන ගැනීමට හැකි පරිදි කායප්පදසාය ක්‍රියා කරන අතර ඒ සියලු තත්වයන් පොට්ඨබ්බ ලෙස සැලකිය හැකි ය.

මේ අනුව ඉන්ද්‍රිය සංවේදනය හා සංජානන ක්‍රියාවලියට අදාළව ක්‍රියාත්මක වන කායික ව්‍යූහයන්, ඒවායෙහි ක්‍රියාකාරිත්වයන් හා ගෝචර වන අරමුණු පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකි ය.

| ඉන්ද්‍රිය | ප්‍රතිග්‍රාහක ව්‍යූහය | විෂය/ ගෝචර රූපය |
|---|---|---|
| ඇස | චක්ඛු පසාදය | වර්ණය/ ඡායාව/ ආලෝකය/ පැහැය |
| කණ | සොත පසාදය | ශබ්දය |
| නාසය | ඝාණ පසාදය | ගන්ධය |
| දිව | ජිව්හා පසාදය | රස |
| සම (ශරීරය) | කාය පසාදය | පඨවි (තද බව/ සැහැල්ලු බව) |
| සම (ශරීරය) | කාය පසාදය | පඨවි (තද බව/ සැහැල්ලු බව) තේජො (උණුසුම/ සිසිලස) වායෝ (පිම්බෙන, හැකිලෙන, සෙලවෙන, නලියන ස්වභාවයන්) |

## විකාර රූප සහ ශරීරය පිළිබඳ දැනීම

ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය යනුවෙන් විකාර රූප තුනකි. ශරීරයෙහි විශේෂ වූ ආකාරයන්, විශේෂ වූ තත්වයන් ඇති වීම යන අර්ථයෙන් විකාර රූප නමින් හඳුනවයි (රත්නපාල, 2004: 495). ලහුතා රූපය යනු ශරීරයෙහි සැහැල්ලු බව පිළිබඳ දැනීමයි. ආහාර, ඍතු, චිත්ත ආදියෙහි බලපෑම හේතුවෙන් විවිධ තත්වයන් ඇති විය හැකි අතර එම තත්වයන් දැනීමට සලස්වන්නේ ලහුතා රූපයයි. මුදුතා රූපය යනු ශරීරයෙහි ලිහිල් බව, මොළොක් බව, තද බව ආදිය පිළිබඳ දැනීමයි. කම්මඤ්ඤතා යනු ශරීරයෙහි ක්‍රියාශීලී බව හෙවත් කර්මණ්‍ය හෝ අකර්මණ්‍ය බව හෝ පිළිබඳ දැනීම සහ අකර්මණ්‍ය බව බිඳ කර්මණ්‍ය බව ඇති කර ගැනීමේ ශක්තියයි. මෙසේ මෙම විකාර රූප මගින් නිරූපණය කරන්නේ ශරීරයහි සමස්ථිතිය පවත්වාගෙන යාමට අදාළ ජීවවිද්‍යාත්මක පැතිකඩ බව සැලකිය හැකි ය.

## නිගමනය

මිනිසාගේ ක්‍රියාකාරිත්වයෙහි කායික හෙවත් ජීවවිද්‍යාත්මක පදනම පිළිබඳව කරුණු ඉදිරිපත් කරන බෞද්ධ මූලාශ්‍රය අතර අභිධර්ම

පිටකයෙහි රූප පරමාර්ථ විග්‍රහය සුවිශේෂ වෙයි. එම රූප විග්‍රහයට අනුව පුද්ගල ශරීරය සකස් කරන සතර මහා භූතධාතූන් සහ ඒවා උපාදාය කර ගනිමින් ක්‍රියාත්මක වන අනෙකුත් රූප කලාප සමූහනය වීමෙන් පුද්ගලයා විවිධ චර්යාවන් අවස්ථානුකූලව නිරූපණය කරන බව නිගමනය කළ හැකි ය.

බොහෝ විට මිනිසුන් විවිධ ක්‍රියාවන් කිරීමට හා විවිධ වචන ප්‍රකාශ කිරීමට සිත් යොදවන්නේ වුවත් ඒවා චර්යාවන් බවට පත් නොවෙයි. එනම්, කායික හෝ වාචසික වශයෙන් යම්කිසි චර්යාවක් සිදු කිරීමට මනස පමණක් ක්‍රියාක්මක වීම ප්‍රමාණවත් නොවන බව ඉන් ප්‍රකට වෙයි. ඒ සඳහා චිත්තය සමඟ කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති යන විඤ්ඤත්ති රූප ප්‍රමුඛව ක්‍රියාත්මක විය යුතු බවත් සතර මහා භූතධාතූන් සහ අනෙකුත් උපාදාය රූපයන් ද ඊට පරිවාර වශයෙන් ක්‍රියාත්මක විය යුතු බවත් පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි ය. ඒ අනුව මිනිස් චර්යාව සඳහා මානසික සාධකයන්ට අමතරව ප්‍රබල ජීවවිද්‍යාත්මක පදනමක් ක්‍රියාත්මක විය යුතු බව නිගමනය කළ හැකි ය.

තවද, පුද්ගල චර්යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් විය හැකි බවත් එසේ වෙනස් වීමට බලපාන්නා වූ ජීවවිද්‍යාත්මක හේතු මොනවාද යන්නත් මෙහිදී අනාවරණය කරන ලදී. ඒ අනුව පුද්ගලයාගේ ප්‍රතිසන්ධි චිත්තයෙන් පසු එළඹෙන ඊළඟ චිත්තක්ෂණයේ පටන් ක්‍රියාත්මක වන භාවරූපයන්ට අනුව ස්ත්‍රී පුරුෂ බව තීරණය වන බවත්, එම භාව රූපයන් සමස්ත ජීවරසායනික ක්‍රියාවලිය සඳහා ම බලපාන බවත්, ඒ හේතුවෙන් ස්ත්‍රී හා පුරුෂ පුද්ගලයන් ඊට යෝග්‍ය පෞරුෂ ලක්ෂණ හා මනෝසමාජීය චර්යාවන් පෙන්නුම් කරන බවත් නිගමනය කළ හැකි ය.

වසර මිලියන ගණනක් තිස්සේ සිදු වූ මානව පරිණාමය පිළිබඳ විග්‍රහය, කය සහ මනස අතර සම්බන්ධය පිළිබඳ විග්‍රහය, ඉන්ද්‍රිය ඥාණ ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහය, ස්ත්‍රී පුරුෂ භාවය මත පෞරුෂ ලක්ෂණ හා චර්යාවන් වෙනස් වන ආකාරය පිළිබඳ විග්‍රහය ආදි කරුණු සලකා බැලීමේදී බෞද්ධ ඉගැන්වීම් ජීවමනෝවිද්‍යාත්මක සංකල්ප සමග බෙහෙවින් සමගාමී වන බව පෙන්වා දිය හැකි ය.

එමෙන් ම බෞද්ධ විග්‍රහය තුළ බටහිර විග්‍රහයෙන් වෙනස් වන හා ආවේණික කරුණු ද ඉදිරිපත් කෙරෙන බව නිරීක්ෂණය වේ. ඒ අනුව, මිනිස් චර්යාවට බලපාන කායික හෙවත් ජීවවිද්‍යාත්මක සාධක පිළිබඳව බුදු දහම තුළ ආවේණික කරුණු ඇතුළත් පුලුල් න්‍යායාත්මක පදනමක් සහිත බව, පුද්ගල චර්යාවෙහි කායික පැතිකඩ පැහැදිලි කරන ජීවමනෝවිද්‍යාවක් බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රිතව ගොඩනැගිය හැකි බව, බෞද්ධ මනෝචිකිත්සනය තුළ පුද්ගල චර්යා සංස්කරණය කිරීමේදී මෙම ජීවවිද්‍යාත්මක සාධක කෙරෙහි ද සැලකිලිමත් වීමේ උපයෝගිතාවක් පවතින බව යන කරුණු මෙමගින් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


චන්දවිමල නාහිමි, රේරුකානේ. (2016). *අභිධර්මාර්ථ සංග්‍රහය* (12 මුද්‍රණය). පොකුණුවිටඃ චන්දවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

චන්දවිමල නාහිමි, රේරුකානේ. (1949 ප්‍ර.මු.). *අභිධර්මයේ මූලික කරුණු* (2016, 20 මුද්‍රණය). පොකුණුවිටඃ චන්දවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

*දීඝ නිකාය 3*. අග්ගඤ්ඤ සූත්‍රය. බු.ජ.ත්‍රි.ග්‍ර.මා. (2006 මුද්‍රණය). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ධම්මසංගණිප්පකරණට්ඨ කථා* (පරි.). (2008). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පේමරතන හිමි, සූරක්කුලමේ. (2010). *බෞද්ධ මනෝවිද්‍යාව*. කොළඹඃ දයාවංස ජයකොඩි සහ සමාගම.

රත්නපාල, අමරදාස. (2004). *අභිධර්මාර්ථ ප්‍රදීපිකා*. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය 2*, නළකලාප සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සන්න සහිත සිංහල විශුද්ධි මාර්ගය* (4 වන මුද්‍රණය). (2015). සංස්. මාතර ශ්‍රී ධර්මවංශ හිමි. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

හෙට්ටිආරච්චි, ධර්මසේන. (2006). *බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය*. මරදානඃ දයාවංශ ජයකොඩි සහ සමාගම.

Kalat, James W. (2004). *Biological Psychology* (8th edn). Canada: Thomson Wadsworth Learnin.